# THE CONTRIBUTION OF THE BUDDHIST PHILOSOPHICAL CONCEPTS, INCLUDED IN EXEGETICAL BOOKS TO SOLVE PROBLEMS.

Ven. NA Sudhammika[1]

**Abstract**

The present study, titled *"The Contribution of Buddhist Philosophical Concepts to Solving Psychological Problems: As Included in Sinhala Exegetical Books,"* was carried out within the broader framework of interrelated key Buddhist philosophical concepts. The research primarily sought to examine whether Buddhist philosophical ideas can be effectively applied to address problems. The main objective was to critically evaluate the applicability of these concepts, as represented in Sinhala exegetical literature, in resolving human problems. Additional objectives included determining whether the term *Bosath* (intelligent being), along with related philosophical notions, could be applied to individuals engaged in inner development according to the Doctrine, with the goal of achieving personal liberation and assisting others in transcending the karmic cycle (*samsara*). The study also aimed to identify how these concepts contribute to the realization of the *Dhamma* and the cultivation of virtuous personal qualities. Furthermore, the research explored the potential of these philosophical concepts to mitigate social and psychological challenges and foster the development of a virtuous society. The significance of the Bodhisattva concept in the context of spiritual advancement was also examined. The hypothesis proposed that the concepts of *Buddha*, *Bodhi*, and *Bosath* are deeply interconnected with other Buddhist philosophical principles. The guiding research questions focused on defining Buddhist concepts, understanding the nature of problems, examining the application of Buddhist concepts in selected exegetical texts, and assessing their practical relevance in problem-solving, especially within the Mahayana philosophical framework. The scope of the study was confined to four Sinhala exegetical texts—*Dhampiya Atuva Gatapadaya*, *Dharmapradipikawa*, *Pujawaliya*, and *Visuddhimarga Sannaya*—and three interrelated concepts: *Buddha*, *Bodhi*, and *Bosath*. Based on a qualitative methodology involving textual analysis and literature review, the findings indicate that a Buddhist-based model of problem-solving can be formulated through critical examination, clarification, and interpretation of the selected sources.

***Keywords***: Exegetical literature, Problem solving, Philosophical concepts, Buddhism, Righteous

[1]Deprtment of Sinhala & Mass Communication, University of Sri Jayewardenepura, Sri Lanka.

Email: anurammika@gmail.com https://orcid.org/0009-0006-5982-0689

Proceeding of the 3rd Desk Research Conference – DRC 2025 © 2025 by The Library, University of Kelaniya, Sri Lanka is licensed under CC BY-SA 4.0

Received date: 01.09.2025 Accepted date: 09.10.2025
Print Publishing Date: 31.10.2025 Web Publishing Date: 31.10.2025

# ගැටලු නිරාකරණයෙහිලා බෞද්ධ දාර්ශනික සංකල්පයන්හි දායකත්වයඃ ව්‍යාඛ්‍යාන කෘති ඇසුරින්

**එන්.ඒ. සුධම්මිකා භික්ෂුණිය**

**සාරසංක්ෂේපය**

ගැටලු නිරාකරණයෙහිලා බෞද්ධ දාර්ශනික සංකල්පයන්හි දායකත්වයඃ ව්‍යාඛ්‍යාන කෘති ඇසුරින්' නම් වූ පර්යේෂණ මාතෘකාව විමසීමේ දී පර්යේෂණ ගැටලුව වූයේ, ගැටලු නිරාකරණයෙහිලා බෞද්ධ දාර්ශනික සංකල්ප යොදා ගත හැකිද?යි විමසීමයි. ප්‍රධාන අරමුණ වූයේ සිංහල ව්‍යාඛ්‍යාන කෘතිවල සඳහන් වී ඇති බෞද්ධ දාර්ශනික සංකල්ප ගැටලු නිරාකරණයට යොදා ගත හැකි ද? විමසීමයි. වෙනත් අරමුණු යටතේ සත්පුරුෂ ජනසමාජයක් බිහි කිරීමට දාර්ශනික සංකල්ප යොදා ගත හැකිද? පුද්ගල ආධ්‍යාත්ම සංවර්ධනයෙහිලා බෝසත් සංකල්පයේ ඇති වටිනාකම කෙබඳු ද? පර්යේෂණ ප්‍රශ්න ලෙස බෞද්ධ දාර්ශනික සංකල්ප යනු මොනවාද? බුද්ධ, බෝධි බෝසත් සංකල්ප මහායාන සංකල්පද? ආදී කරුණු කෙරෙහි අවධානය යොමු කරන ලදි. පර්යේෂණ සීමා යටතේ බෞද්ධ දාර්ශනික සංකල්ප බොහොමයක් ඇති බැවින් මෙහි දී එකිනෙක බැඳී ඇති බුද්ධ, බෝධි, බෝසත් සංකල්ප පමණක් සිංහල ව්‍යාඛ්‍යාන කෘතිවල සඳහන් වී ඇත්තේ කෙසේදැයි කෘති කෘති හතරක් ඇසුරින් විමසන ලදි. පර්යේෂණ ක්‍රමවේදය වූයේ තෝරාගත් සිංහල ව්‍යාඛ්‍යාන ග්‍රන්ථවලින් දත්ත රාශී කිරීම, දත්ත වර්ගීකරණය සහ දත්ත විශ්ලේෂණය කිරීමෙන් නිගමනයකට එළැඹීමයි. සාහිත්‍ය විමර්ශනය යටතේ ධම්පියා අටුවා ගැටපදයත් ධර්මප්‍රදීපිකාවත් විවිධ මූලාශ්‍රය භාවිතයෙන් රචනා වී ඇති පූජාවලියත් විශුද්ධිමාර්ග මහා සන්නයත් ඇසුරින් ඉහත කී සංකල්පත්‍රය විමසන ලදි. ඒ හා බැඳුණු කරුණු සාකච්ඡා කර ඇති විචාර මූලාශ්‍රය ග්‍රන්ථ ලෙස ශ්‍රී මහා බෝධීන්වහන්සේ හා තදනුබද්ධ මූලාශ්‍රයන්හි ඇතුළත් සංස්කෘතිය, බෝ විසිතුර, බණ සහ බුදුසමය, සිංහල බුදුසමය යන කෘති භාවිත කරන ලදි. ඒ හැර අපගේ පර්යේෂණයට අදාළ කරුණු පැහැදිලි කර ගැනීමට ඊට අදාළ වෙනත් සාහිත්‍ය මූලාශ්‍රය ද භාවිත කෙරිණි. එහි දී අදාළ පරිදි දාර්ශනික සංකල්ප භාවිත වී ඇති ආකාරයත් ඒවායේ සංවර්ධනත් මොනවාදැයි විමසීමෙන් නිගමනයට එළඹුණි. එනම් බෞද්ධ දාර්ශනික සංකල්ප හඳුනා ගැනීමෙන් ඒවා ප්‍රායෝගිකව භාවිත කිරීමෙන් ගැටුම් නිරාකරණය කර ගත හැකි බවය. බෞද්ධ දාර්ශනික සංකල්ප හඳුනා නොගැනීමත් ප්‍රායෝගිකව ජීවිතයට බද්ධ කර නොගැනීමත් නිසා ගැටුම් බහුල වේ. සත්පුරුෂ ජනසමාජයක් යනුවෙන් අදහස් කරනුයේ ගැටුම් අවම සාමකාමී සමාජයකිඃ යනු අපගේ නිගමනය විය.

***ප්‍රමුඛ පදඃ*** ගැටලු නිරාකරණය, බෞද්ධ, දාර්ශනික සංකල්ප, ව්‍යාඛ්‍යාන, සත්පුරුෂ

## හැඳින්වීම

'බුධ-බෝධ්-බෝධනෙ-බෝධති' යන සංස්කෘත ක්‍රියාපද විග්‍රහයේ බලපෑමෙන් පාලි භාෂාවේ ද 'බෝධති-අවබෝධ කරයි-වෙයි යනාදී අර්ථ ලැබේ. බෞද්ධ ඉගැන්වීම් අනුව චතුරාර්ය සත්‍යාවබෝධය ලැබීම ගැන අවධාරණය කෙරේ. චතුරාර්ය සත්‍යාවබෝධඥානය 'බෝධි' යන පාලි පදයෙන් අරුත් ගැන්වෙයි. 'තං බෝධි වුච්චති චතුසු මග්ගේසු ඤාණං' යන සංයුත්ත නිකාය පාඨයෙන් ගම්‍ය වන්නේ 'බෝධි' යනු චතුරාර්ය සත්‍ය පිළිබඳ මාර්ගඥානය' බවයි. උත්කෘෂ්ට ඥාන ශක්තියකින් ලෝකස්වභාවය අවබෝධ කරගත් පුද්ගලයා හැඳින්වීමට 'බුද්ධ' යන පදය භාවිත වේ. අවබෝධය ලබන ක්‍රම තුනකි. සම්මා සම්බුද්ධ, පච්චේක බුද්ධ සහ අරහන්ත බුද්ධ යනුවෙනි. මෙම වදන් පාලි සහ සංස්කෘත භාෂාවලින් සිංහලට පැමිණියත් ඉංග්‍රීසි ආදී භාෂාවන්හි මෙම වදන් සහ අරුත් නොලැබේ. එබැවින් භාෂාව ද විශේෂ වූවකි.

'බුද්ධ' සහ 'බෝධිසත්ව හෙවත් බෝසත්' සංකල්ප පිළිවෙළින් 'සිංහල ගත්කතුවරු භාවිත කර ඇත්තේ සම්මා සම්බුද්ධත්වයට පත් වූවකු සහ එම බුද්ධාංකුරයා හැඳින්වීමටයි. පච්චේක බුද්ධ හෝ අරහන්ත බුද්ධත්වයට පත් වීම සඳහා ද සිත පුහුණු කරමින් ඥානවන්තභාවය වැඩි දියුණු කළ යුතු වුවත් ථේරවාද සම්ප්‍රදායේ දී ඒ සඳහා බෝධිසත්ව හෙවත් 'බෝසත්' නාමය භාවිත කර නැත. එහෙත් සෑම පුද්ගලයෙකුටම බුද්ධිමත්ව සිතීම, කටයුතු කිරීම ආදියෙන් බෝසත් ගුණධර්ම සිත්වලට පුහුණු කළ හැකිය.

ඉන්දියානුවන් තම හින්දි භාෂාවට සමීප භාෂාවන්ගෙන් බුද්ධගයා, බෝධිගයා යනුවෙන් හඳුන්වන්නේ ද ගෞතම බුදුන්වහන්සේ අවබෝධය ලද ස්ථානයයි. 'බුද්ධ' යන පදය හා බැඳුණු බෝධි යන්න, ගෞතම බුදුන්වහන්සේට සත්‍යාවබෝධය ලැබීමට සෙවණ දුන් ඇසතු වෘක්ෂය හැඳින්වීමට ද යොදති. එම ඇසතු වෘක්ෂය 'බෝධි වෘක්ෂ' නමින් ඉන්දියානුවෝ ද බෝධීන්වහන්සේ නමින් ගෞරවාර්ථය සහිතව ලාංකේයයෝ ද හඳුන්වති. මේ ලෝක ප්‍රකට ඇසතු වෘක්ෂය හැර බෝධි නමින් වෙනත් වෘක්ෂයක් ලොව කොහේවත් නැත. බෝධි යනු පාලි බසින් අවබෝධය, ඥානය, ප්‍රඥාව යන අරුත් ලැබෙන පදයකි. බෝධිසත්ව යන පාලි පදය සිංහලට බිඳී ඇත්තේ බෝසත් යනුවෙනි. බෝසත් යනු ඥානය පුහුණු කරන හෝ ඥානවන්ත සත්වයා යන අරුතයි.

පර්යේෂණ ප්‍රශ්න ලෙස බෞද්ධ දාර්ශනික සංකල්ප යනු මොනවාද?යි විමසීමේ දී චතුරාර්ය සත්‍ය හා බැඳුණු හේතු-ඵල දහම හෙවත් පටිච්ච සමුප්පාදය, ත්‍රිලක්ෂණය, කර්මය, පුනර්භවය සහ නිර්වාණය යන සංකල්ප හඳුනා ගත හැකියි. දාර්ශනික ලෝකයේ විවිධ අත්හදා බැලීම් අනුව සංසාරය සහ නිර්වාණය යන සංකල්ප දෙක ඇති වීම, පැවතීම සහ නැවැත්ම ගැන සිදු කළ පර්යේෂණවල ප්‍රතිඵල ලෙස හඳුනා ගත හැකිය.

'බුද්ධ' සහ 'බෝධිසත්ව හෙවත් බෝසත්' සංකල්ප මහායාන ද? යන ප්‍රශ්නයට පිළිතුර විමසීමේ දී 'මහායාන ථේරවාද සම්ප්‍රදායන් බුද්ධ පරිනිර්වාණයෙන් පසුව ඇති වූ බෙදීම්ය. බුදුදහමින් පැහැදිලි කර දෙන්නේ ලෝක ස්වභාවය ගැන එකම සත්‍යයකි. එබැවින් වචනවලින් කියැවෙන අරුත ඉක්මවන ආර්ය සත්‍යාවබෝධයට කෙනෙක් උත්සාහ කෙරේ නම් ඔහු හෝ ඇය බෝධිසත්ව නාමයෙන් හැඳින්විය හැකිය.'

ලංකාව ථේරවාද බුදුදහමට අනුගත රටකි. එබැවින් ලංකාවේ රචනා වූ ග්‍රන්ථවල සඳහන් වන්නේ මහායාන බෝසත්වරුන් නොව අප ගෞතම බුදුන්වහන්සේගේ පෙර භව ගැන කියැවෙන ජාතකකථා සහ අවසන් ආත්ම භාවයේ එනම් සිදුහත්කුමරු ලෙස ගත කළ ගිහි ජීවිතයත් අභිනිෂ්ක්‍රමණයෙන් පසු බුද්ධත්වය දක්වා පැවිදි බෝසත් චරිතයත් යන තොරතුරුය.

මනුෂ්‍යයකු ලෙස උපන් ගෞතම සිද්ධාර්ථ කුමරු වසර විසි නවයක් ගිහි ගෙයි වාසය කොට පැවිදිව වසර හයක ආධ්‍යාත්මික පර්යේෂණයකින් චතුරාර්ය සත්‍යය, පටිච්ච සමුප්පාදය ආදී ඤාණයෙන් අවබෝධ කර ගත යුතු ලෝක සත්‍යයන් අවබෝධ කර ගත්හ. එම යථාර්ථවාදී සත්‍ය දහම දෙව් මිනිසුන්ට ශාස්තෘ වෙමින් දේශනා කළහ. එම දේශනා

වාචනා මාර්ගයෙන් සියවස් ගණනාවක් භාණක පරම්පරා විසින් සුරක්ෂිතව රැගෙන විත් ලේඛන ගත කරනු ලැබීමෙන් අනතුරුව මුද්‍රිත මාධ්‍යයක් බවට පත් වන තෙක් ම සුරක්ෂිත වූ මුල්ග්‍රන්ථවලට ලියන ලද අටුවා, ගැටපද, සන්න, පරිකතා, ආදී කෘති හරහා පරිණාමය වෙමින් පැමිණි සැටි අවධානයට ලක් විය. එම සිංහල කෘතිවල ඇතුළත් වී ඇති බෞද්ධ දාර්ශනික සංකල්ප සමාජගත වී ඇති ආකාරය සහ ගැටලු නිරාකරණයට යොදා ගත හැකි ආකාරය විමසීම මෙහි ප්‍රධාන අරමුණ විය.

**පර්යේෂණ ගැටලුව**
**ගැටලු** නිරාකරණයෙහිලා බෞද්ධ දාර්ශනික සංකල්ප යොදා ගත හැකිද? විමසීමයි.

**ප්‍රධාන අරමුණ**: සිංහල ව්‍යාඛ්‍යාන කෘතිවල සඳහන් වී ඇති බෞද්ධ දාර්ශනික සංකල්ප ගැටලු නිරාකරණයට යොදා ගත හැකි ද?

**වෙනත් අරමුණු** යටතේ සත්පුරුෂ ජනසමාජයක් බිහි කිරීමට සහ ගැටුම් අවම කර ගැනීමට දාර්ශනික සංකල්ප යොදා ගත හැකිද? පුද්ගල ආධ්‍යාත්ම සංවර්ධනයෙහිලා බෝසත් සංකල්පයේ ඇති වටිනාකම කෙබඳු ද?

**පර්යේෂණ ප්‍රශ්න** ලෙස බෞද්ධ දාර්ශනික සංකල්ප යනු මොනවාද? බුද්ධ, බෝධි බෝසත් සංකල්ප මහායාන සංකල්ප දැයි විමසීම.

**පර්යේෂණ ක්‍රමවේදය** වූයේ තෝරාගත් සිංහල ව්‍යාඛ්‍යාන ග්‍රන්ථවල බුද්ධ, බෝධි, බෝසත් යන සංකල්ප භාවිත වී ඇති ආකාරය ගැන දත්ත රාශී කිරීම, දත්ත වර්ගීකරණය සහ දත්ත විශ්ලේෂණය කිරීමෙන් නිගමනයකට එළැඹීමයි.

**පර්යේෂණ සැලැස්ම**: සම්භාව්‍ය සාහිත්‍ය කෘති හෙවත් ද්විතීයක මූලාශ්‍රය හා විචාර මූලාශ්‍රය ඇසුරින් මෙම පර්යේෂණය සිදුකරන ලදි.

**පර්යේෂණ ක්‍රමෝපායන්**: අපගේ පර්යේෂණයට අදාළ සංකල්පත්‍රය ගැන සිංහල සාහිත්‍ය ග්‍රන්ථවල භාවිත ආකාරය රාශී කොට වර්ගීකරණය කිරීමෙන් හා දත්ත විශ්ලේෂණයෙන් සිදු කළ ගුණාත්මක පර්යේෂණයෙන් නිගමනයකට එළඹීමයි.

**අධ්‍යයන පසුබිම**
ලාංකේය සිංහල භාෂාව කථක-ශ්‍රාවක, ලේඛක- පාඨක සමාජය පශ්චාද් බෞද්ධ යුගයෙන් පසු විවිධ සාහිත්‍ය යුග පසු කර වර්තමානය වන විට තාක්ෂණික මෙන්ම කෘත්‍රිම බුද්ධිය භාවිත කරන සමාජයක් දක්වා පරිණාමය වී තිබේ. බෞද්ධ යනු බුද්ධිමත්ව සිතන කටයුතු කරන පුද්ගලයා යනුයි. එය සියවස් විසි පහකට පමණ ඈත යුගයේ දී එසේ අර්ථ ගැන්වුණත් කාලයත් සමග උපතින් බෞද්ධ නාමය ලැබෙන තත්ත්වයක් ඇති වී තිබේ. මව්පියන් බෞද්ධ නම් ඒ මග අනුගමනය කරන දරුවන් ගැන ද ලේඛන ගත කිරීමටත් ලාංකිකයෝ පුරුදු පුහුණු වී සිටිති. ලෝකයේ බෞද්ධ ජනතාව විමසන විට ශ්‍රී ලංකාව ඉන්දියාව හැර ලිඛිත බුදු දහම කියවීමෙන්, ශ්‍රවණයෙන් යථාර්ථවාදී චින්තනයට අවකාශ සලසා ගනිත්. එම ඉගැන්වීම් ප්‍රායෝගික කරගන්නා පිරිසක් හඳුනා ගත හැකිය. බුදුන්වහන්සේ දේශිත යථාර්ථවාදී දහම අනුගමනය කිරීමෙන් ආධ්‍යාත්ම සැනසිල්ල උදා කර ගත හැකිය. බුද්ධිමත් හැසිරීම, ක්‍රියාකාරකම් සමාජ ජීවිතයේ දී ගැටුම් අවම කර ගැනීමට ද එම බෞද්ධ දාර්ශනික සංකල්ප තම නුවණින් දැන හඳුනා ගෙන පුහුණු වීමෙන් සාමකාමී, සත්පුරුෂ ජනසමාජයක් බිහිකර ගැනීමට හැකිදැයි විමසීම මෙම පර්යේෂණයේ මුඛ්‍ය අරමුණ විය.

බෞද්ධ දාර්ශනික සංකල්ප යනු මොනවාද? ඒවා ථේරවාදී හෝ මහායාන සංකල්ප දැයි විමසීමේ දී එය එකම ශාස්තෘවරයකුගේ ඉගැන්වීමක් බැවින් පශ්චාද්කාලීන බෙදීම්වලට අදාළ නොවන බවත් බුද්ධ යනු විශිෂ්ට ඥානය සහිත මහාපුරුෂයකු හැඳින්වීමට යොදන සංඥා නාමයක් බවත් බෝධි යනු ද අවබෝධය ලැබීම බවත් බෝසත් හෙවත් බෝධි සත්ව යනු අවබෝධය ලැබීමට සිත පුහුණු කරන පුද්ගලයා හැඳින්වීමට යොදා ගන්නා වචනයක් බවත් හඳුනා ගන්නා ලදි.

මෙම සංකල්ප සිංහල ලේඛනවල සඳහන් වී ඇත්තේ බුදුදහම මෙරටට හඳුන්වා දීමෙන් පසුව ය. බෞද්ධයා දැකිය යුතු යථාර්ථය, ලෝක ස්වභාවය මෙම දාර්ශනික සංකල්පවලින් ඉගැන්වේ. අනුරාධපුර සාහිත්‍ය යුගයේ පටන් දඹදෙණි යුගය දක්වා රචිත ව්‍යාඛ්‍යාන කෘති මෙන්ම සම්භාව්‍ය සාහිත්‍ය කෘතිවල අන්තර්ගත ඉහත කී දාර්ශනික සංකල්ප අතුරින් බුද්ධ, බෝධි, බෝසත්, සංකල්පත්‍රය කෙරෙහි පමණක් අවධානය යොමු කරන ලද්දේ ඒ සමග සියලු සංකල්ප එකිනෙක බැඳී ඇති බැවිනි.

මෙම සංකල්ප අරුත් ගන්වා ඇති මාගධී හෙවත් පාලි බසින් කථිත බුද්ධ දේශනා මෙරටට වාචනා මාර්ගයෙන් රැගෙනවිත් ලේඛන ගත කිරීම මිහිඳු මහරහතන්වහන්සේ ඇතුළු මෙරට ආරම්භක පැවිදි ආචාර්යවරුන් විසින් සිදු කර තිබේ. ලේඛනගත කිරීමෙන් එම දහම සංරක්ෂණය වී තිබේ. පශ්චාත් කාලීනව පරිවර්තන අනුවර්තන, ප්‍රතිකථන ලෙස සිංහල සාහිත්‍ය කෘතිවලට පැමිණ ඇති ක්‍රමය කෙරෙහි අවධානය යොමු කෙරේ. පුද්ගල ආධ්‍යාත්ම සංවර්ධනයෙහිලා මෙම සංකල්ප කොතරම් දායකත්වයක් ලැබ දෙන්නේ ද යන්න විමසීමට එම සංකල්ප ගැන හඳුනා ගත යුතුව ඇත. බුද්ධ සංකල්පය සිංහල සමාජයේ අර්ථ ගැන්වී ඇත්තේ ප්‍රාතිහාර්ය සහිත මහා පුරුෂ සංකල්පය ද සමගය.

'බුද්ධ' සංකල්පය මහාපුරුෂ සංකල්පයක් ලෙස භාරතීය දාර්ශනිකයන් අතර අවධානයට ලක් වී තිබුණි. ඒ ක්‍රි. පූ. හය වන සියවසේ දී ය. (වින්ටර්නිට්ස්, එම්., තෙවන මුද්‍රණය, 1967, ) මහාපුරුෂ සංකල්පය හා බැඳුණු, 'බුද්ධ සංකල්පය' ඥාන ගවේෂණයෙහි යෙදුණු පුද්ගලයින් සඳහා භාවිත කිරීම භාරතීය දර්ශනයෙහි විශේෂ වූවක් විය. (එම,) 'බුද්ධ' සංකල්පය දෙවියන් අතර භාවිත වී ඇත්තේ බුද්ධ කෝලාහලය නමිනි. (ඤාණවිමල හිමි: කිරිඇල්ලේ, 2005, 28 පිටුව)

බෝධි හා බැඳුණු බෝධිසත්ව සංකල්පය සිංහලට බිඳී ඇත්තේ බෝසත් යනුවෙනි. බෝසත් සංකල්පය මහායාන ඉගැන්වීමක් ලෙස ථේරවාදීන් විසින් සලකනු ලැබුවත් සිංහල ග්‍රන්ථ කර්තෘහු තම කෘතිවලට බෝසත් සංකල්පය ඇතුළත් කළේ, 'අප බුදුන්' යනුවෙන් ඉතා ශ්‍රද්ධාවෙන් හැඳින්වූ ගෞතම බුදුන් වහන්සේගේ බෝධිසම්භාර හෙවත් නුවණැස පුහුණු කරන කාලය ගැන සඳහන් කිරීමටයි. 'සයංභූ, සයං අභිඤ්ඤා සච්ඡිකත්වා' ආදී තන්හි සම්මා සම්බුද්ධත්වය හැඳින්වීමට යොදා ඇති වචනවලින් කියැවෙන උත්තම ඥාන ශක්තිය අවදි කර ගැනීමත් සිද්ධාර්ථ ගෞතම සම්මා සම්බුදු

රජාණන්වහන්සේගේ බෝධිසත්ව ජීවිතයත් බුද්ධ සහ බෝසත් යන දෙවදනින් සිංහල සාහිත්‍ය කෘතීන්හි භාවිත කොට ඇත.

ගෞතම සිද්ධාර්ථ බෝධිසත්ව චරිතය කොටස් තුනකින් හඳුනා ගත හැකියි. එනම් සිද්ධාර්ථ කුමරුගේ පූර්ව ආත්මභාවඃ බුද්ධ දේශනා ලෙස ජාතක පාළිය, ජාතකට්ඨකතා, ජාතක අටුවා ගැටපදය, ජාතක පොත් වහන්සේ යනුවෙන් කෘති කිහිපයක හඳුනා ගත හැකිය. පෙර විසූ ජීවිත දැකීමේ ඤාණය හෙවත් පුබ්බේ නිවාසානුස්සති ඥානයෙන් දැන ගත් පෙර භවවල කථා ජාතක නමින් දේශනා කර ඇත. එහි ඇතුළත් බෝධිසත්ව චරිත විවිධත්වය පන්සිය හතළිස් හතකි. අවසන් ආත්මභාවයේ සිද්ධාර්ථ කුමරුගේ ගිහිජීවිතය (වයස අවු. 01-29) දක්වා බෝධිසත්ව අවධියයි. වයස අවුරුදු 29 දී අභිනිෂ්ක්‍රමණය කිරීමෙන් පසුව බුද්ධත්වය ලබන තෙක් තවුස් පැවිදි කාලය (වයස අවු. 29-35) යන අවස්ථා තුනයි. වයස අවුරුදු 35 දී ගෞතම සිද්ධාර්ථ තවුසා බුද්ධත්වයට පත් විය. එතැන් පටන් තොරතුරු වාර්තා වෙන්නේ බුද්ධ චරිතය (වයස අවු. 35-80) යනුවෙනි. ඒ හැර සිංහල ග්‍රන්ථවල ඇතුළත් වන්නේ අනාගතයේ බුදුවන මෛත් බෝසත් තොරතුරු පමණි. මෙම තොරතුරු, අමාවතුර, බුත්සරණ, ධර්මප්‍රදීපිකාව, සද්ධර්ම රත්නාවලිය සහ පූජාවලිය යන කෘතිවල පිළිවෙළින් තම ග්‍රන්ථයට ගැළපෙන ලෙස යොදා ගෙන තිබේ.

බුදු සිරිත සහ බෝසත් සංකල්පය සිංහල ජන සමාජයට බලපෑම් කළේ ක්‍රි. ව. 9 වන සියවස අගභාගයේ දී සේන සලමෙවන් රජු විසින් සංස්කෘතයෙන් සිංහලට නගන ලද 'සියබස්ලකර' අනුවර්තනයේ දී දෙන ලද උපදේශය අනුවය. පෙදෙන් බුදු සිරිතෑ යන්නෙන් පද්‍යයට බුද්ධ චරිතය යොදා ගන්නටත් ගද්‍ය සඳහා වත් සිරිත් යොදා ගන්නටත් දුන් උපදේශය සිංහල ග්‍රන්ථ කර්තෘවරු අනුගමනය කළහ. එහෙත් බුදුසිරිතට ප්‍රවේශයක් ලෙස බෝසත් සිරිත තම ග්‍රන්ථ අරමුණු ජයගැනීම සඳහා යොදා ගැනීමට පුරුදු වූහ.

ධම්පියා අටුවා ගැටපදයේ සම්බුද්ධ නමින් බුද්ධ සංකල්පය ද සිබවලඳ හා සිබවළඳ විනිසෙහි තුන්ලොවට උතුම් රුවන් තියා යනුවෙන් බුද්ධ, ධම්ම, සංඝ යන රත්නත්‍රය ද ධර්මප්‍රදීපිකාවේ 'අප බුදුන් සරා සැකි කප් සුවහස් මතුයෙහි දිවකුරු බුදුන් හමුවැ... ආදී වශයෙන් දීපංකර බුදුන්වහන්සේගෙන් විවරණ ලත් තැන් පටන් විවිධ ආත්මභාවයන්හි ඉපිද ආදී වශයෙන් බුද්ධ චරිතය සහ බෝසත් චරිතය යන දෙකම එකම තැනක ද වර්ණනයට ලක් කරයි. '

සම්භාව්‍ය පද්‍ය සාහිත්‍ය කෘතීන්හි මුවදෙව්දාවතෙහි 'නමවු තිලොවෙක මිතුරා' (විමලනන්දිතිස්ස හිමි, අහුන්ගල්ලේ, 1949, 1 පිටුව) යනුවෙන් තුන්ලෝකයට අසහාය මිත්‍රයාණන් නමදිව් යනුවෙන් '...සමන්තභද්‍ර ශාක්‍යසිංහයන් වහන්සේගේ පූර්වාවදාන සච්චරිත්‍රාත්මකවර්ණනයක් කටැව්ව මඛාදේව ජාතකය කථාශරීරකොට ස්වභාෂීය පද්‍ය කාව්‍යයක් රචනා කරන' ආදී වශයෙන් ද

ඉතිදු මුනි එක් දෙස් -ගුණ මිණි මලෙව් දැක්මට

මොකැසිර ද බඳ මන මා- යුහු කෙලේ සෙබේ සේ කිවි යනුවෙන් (සසදාවත හෙවත් කාව්‍ය තිලකය, Dr. Thabrew,w. Vivian De,Trn.2021, p.21 ' සසදාවත 06 වන ගීයෙන් ද

'... බෝසත් සර වැනුම් - වියතෙ මුවපත් වේවා! යනුවෙන් කව්සිළුමිණෙහි ද

'නමව් මුනිසරණ' -මහද ගඳකිළි කැර- සවිනේ ගෙවා දත් හට -දුහුනන් දූනුම් සඳහා- කරනෙමි සිදත් සඟරා (සිදත් සඟරා විවරණය කුමාරතුංග, මුනිදාස, බු. ව.2478, 1 පිටුව) යනුවෙන් සිදත් සඟරාවෙහි ද විවිධ සිංහල කෘතිවල බුදුන්වහන්සේ වන්දනය හෝ බෝසත් ජීවිතයට ගෞරවාදරයෙන් සඳහන් කර තිබේ.

සිංහල බෝධිවංසයක් පදනම් කර ගෙන රචිත පාලි මහාබෝධිවංසයට ලියන ලද පරිවාර කෘති ලෙස බෝධිවංස ග්‍රන්ථිපදය සහ ධර්මප්‍රදීපිකා නම් මහාබෝධිවංශ පරිකථාව ද විශේෂ අවධානයට යොමු විය. එම කෘතිවල බුද්ධ, බෝධි බෝසත් සංකල්පයන්ට අර්ථ ලබා දෙන ආකාරය මෙම පර්යේෂණයේ දී අවධානයට ගැනිණි. ඒ අනුව පිළිවෙළින් එම සංකල්ප සිංහල කෘතීන්හි යෙදෙන අවස්ථා උද්ධෘත කිහිපයක් ඇසුරින් විමසන ලදි.

1. බුද්ධ සංකල්පය

සම්බුද්ධත්වය හා බැඳුණු දාර්ශනික සංකල්ප ධම්පියා අටුවා ගැටපදයෙහි සඳහන් වී ඇත්තේ මේ ආකාරයෙනි.

> 'සම්බුද්ධස්ස, 'මගඤණින් සියුසස් තුමහ මෙ ජතුවහ. 'බුජ්ඣිනා සච්චානීති බුද්ධෝ, නොහොත් සම්බුද්ධස්ස, දෙසුන් ඤණින් සියුසස් මුළු ලෝ දැන්වූවහ. බොධෙතා පජායාති බුද්ධො' නොහොත් සවඤණින් මුළුනේ ජතුවහ'' (විමලකීර්ති හිමි, මැදඋයන්ගොඩ, සංස්.1959, 2 පිටුව.)
>
> 'සබ්බං අභිඤ්ඤාසි යදත්ථි ඤෙයාං-තථාගතො තෙන සමන්තචක්ඛු'' (විමලකීර්ති හිමි, මැදඋයන්ගොඩ, එම, 1959, 02 පිටුව.)

( 'සම්මා සම්බුද්ධ' යනු ස්වයංභූඥානය හෙවත් මාර්ග ඥානයෙන් චතුරාර්ය සත්‍යාවබෝධය තමන් විසින් ම දැන ගැනීමයි. බුද්ධියෙන් සත්‍ය අවබෝධ කළ හෙයින් බුද්ධ නම් වේ. එසේ අවබෝධ කරගත් දහම දේශනා කිරීමෙන් හෙවත් චතුරාර්ය සත්‍ය මුළු ලෝකයාට දැන්වූහ. අවබෝධයෙන් සියල්ල දත්හ. ස්වකීය ඥානයෙන් මුළුඥෙය්‍ය මණ්ඩලය දැනගත්හ. එහෙයින් 'දැනගතයුතු සියලු දේ දැනගත්' යන අර්ථයෙන් තථාගතයන්වහන්සේ 'සමන්තචක්ඛු' නම් වේ.)

1.1 බුද්ධඥාන බුද්ධත්වයේ විශිෂ්ට ලක්ෂණයකි. ඒ ගැන 'අභිඤ්ඤාභිවඃ 'දිබ්බචක්ඛු, දිබ්බසෝත, ඉද්ධිවිධ, චේතොපරියඤාණ, පුබ්බේනිවාසානුස්සති ඤාණ, ආසවක්ඛය ඤාණ යන ෂඩ් අභිඤ්ඤා' (විමලකීර්ති හිමි, මැදඋයන්ගොඩ, 1959, 127 පිටුව) යනුවෙන් විශේෂිත වූ ඤාණ හය ගැන සඳහන් කරයි.

පශ්චාත්කාලීනව 'බුද්ධ' සංකල්පය 'සම්බුද්ධත්වයට පත් වූ ශ්‍රේෂ්ඨයකු වෙනුවෙන් පමණක් භාවිත විය. 'පච්චේක බුද්ධ, අරහන්ත බුද්ධ,' යනාදී ධර්මාවබෝධය ලබන ක්‍රම තුනෙන් දෙකක් ගැන අවධානයට ලක් නොකරන එහෙත් සම්මා

සම්බුද්ධත්වය ගැන පමණක් කතා කරන සංකල්පයක් බවට බුද්ධ සංකල්පය සමාජයේ බහුල ව්‍යවහාරයට පැමිණ තිබේ. නුවණේ ඉහළම තත්ත්වය පැහැදිලි කිරීමට 'බුද්ධ' යන පදය භාවිත වේ.

යථාර්ථවාදී ධර්මය වටහා ගන්නා පුද්ගලයා නුවණැති කෙනෙකි. එම අවබෝධයේ විශිෂ්ට හැකියාව, පෘථුලත්වය නිසා, විමසන තාක් ප්‍රශ්න විසඳීමේ හැකියාව බුද්ධවිෂය ලෙස හඳුන්වා තිබේ. ඤාණ ශක්තියේ ප්‍රමාණය අනුව ඕනෑම ප්‍රශ්නයක් විසඳීමේ හැකියාව 'බුද්ධ ලීළ්හ' නම් වේ.

> 'ධම්පියා අටුවා ගැටපදයෙහි '**බුද්ධවිසයං,** බුදුවිසා- පුළුවුත්තාක් පැන විසජනු බුදුවිසා නම්ඃ නොහොත් බුදු මහත්ව බුදුවිසය නම් **බුද්ධලීළ්හං.** බුදුලෙළහ. පැන විසජනෙහි හැඟි නියරක් කටයහන බවු බුද්ධ ලීළ්හ නම් වේ' යනුවෙන් ව්‍යාඛ්‍යාන සපයා ඇත්තේ එයටයි. ඒ හැර, **බුද්ධලීළ්හාය**- බුදුලෙළහයෙන්. (විමලකීර්ති හිමි, මැදඋයන්ගොඩ, 1959, 126 පිටුව.)

> සම්මා සම්බුද්ධත්වයට පත් වන පිනැති මහා පුරුෂයා සතු මහාපුරුෂ ලක්ෂණ ද බුද්ධ දේශනා ඇසුරින් මෙම ග්‍රන්ථවල ඇතුළත් වී තිබේ.

1.2 බුද්ධ ඤාණ 'සසරදී ඤාණය වෙනුවෙන් සිත පුරුදු පුහුණු කිරීමෙන් ලද වාසනාවකි'. එය කුශල කර්මයක ආනිසංස ලෙස ද ගිණිය හැකිය.

1.3 බුද්ධ සුකුමාල බව යනු බුද්ධියේ ශ්‍රේෂ්ඨත්වය, නිසා ඉතා සියුම් ලෙස ආධ්‍යාත්මය දැකීමේ, දැනීමේ ශක්‍යතාවයි. බුදු සුවය නම් චින්තන විශිෂ්ටතාවයයි. (විමලකීර්ති හිමි, මැදඋයන්ගොඩ, 1959, 35 පිටුව.) උදාහරණ ලෙස, බුද්ධිය, වටහා ගැනීමේ හැකියාව නිසා මානසික සැපයෙන් වෙසෙන්නේ බුද්ධ සුකුමාල බව නිසාය.

> 1.4 බුද්ධ බලය යනු ඤාණ බලයයි. ධම්පියා අටුවා ගැටපදයේ 'ඨානා ඨාන ඤාණ බල ඈ දසබල (විමලකීර්ති හිමි, මැදඋයන්ගොඩ, 1959, 35 පිටුව.) යනුවෙන් ඇති කෙටි සඳහන ධර්මප්‍රදීපිකාවේ ද විස්තරාත්මක පරිකථාවක් ඇත.

> 1.5 චතුවේසාරජ්ජඃ සබ්බඤ්ඤු බව, ඛීණාසව බව්, නියෙන ධම් ජනන බැව්, අන්තරය්කුරු ධම් ජනන බව් යන මේ සතර තන්හි විසරු බව් චතුවේසාරජ්ජ නම්. ආදි ගහණින් ආවේණික ධම් ඈ ගන්නේ. (විමලකීර්ති හිමි, මැදඋයන්ගොඩ, එම, 1959. 35 පිටුව)

විශාරද සිවුකරුණු ලෙස සර්වඥ හෙවත් සියල්ල දන්නා බව, ආශ්‍රවයන් ක්ෂය කළ බව, නෛර්යාණික ධර්මය දන්නා බව, අන්තරායකර ධර්ම දන්නා බව' යන මේ සතර ස්ථානයන්හි විශාරද බව චතුවෛශාරද්‍ය නම් වේ. ඒ ආදි වශයෙන් ආවේණික ධර්ම ආදිය ගතයුතුය. යනුවෙන් කතුවරයා පාඨකයාට උපදෙස් දෙයි.

'යාව මෙ අනුපාදාය ආසවෙහි චිත්තං න විමුච්චති.' නොසිතිය යුතු කරුණු හතරක් බව ද එයින් එකක් ලෙස බුද්ධ යන්න ද සඳහන් වී තිබේ. එනම්,

චත්තාරි අචින්තෙය්‍යානි, බුද්ධ විෂය, ලෝක විෂය, ඍද්ධි විෂය කර්ම විෂය විසින් සතර දෙනෙක් නොසිතිය යුතුවෝ. (විමලකීර්ති හිමි, මැදඋයන්ගොඩ, එම, 1959, 182 පිටුව.)

ධර්මප්‍රදීපිකාවේ 'සත්ථා' යන්නට ලියූ 'පරිකථාවේ අනුකථාවක් වූ 'බුද්ධවිෂය අචින්ත්‍ය' (බද්දේගම විමලවංස හිමි, 1959, 3 පිටුව) බව ද එය විස්තර කළ හැකිවන්නේ බුදු කෙනෙකුට ම පමණක් බව ද පුහුදුන්ව සිට බුදුගුණ වර්ණනා කිරීම දුෂ්කර බව ද සඳහන් කරයි.

**2.** බුදුන්වහන්සේ සතු ප්‍රාතිහාර්ය කොටස් දෙකකි. එය ද බුද්ධඥාන හා බැඳී තිබේ.

> 2.1 'ආදෙසනා පාටිහාරිය නම්ඃ ඒවං තෙ මනො' 'ඉතිපි තෙ මනො' යන ආදි විසින් ඔවුනොවුන් සිත් පැවති සේ කියන පෙළහර. ඒ දක්වා කරන අනුසසුන් ආදේසනා පාටිහාරියානුසාසනී නම්.

> 2.2 ඉද්ධි පාටිහාරිය නම්ඃ අහස පළක් අවුළුවා හිඳුනා ඈ පෙළහර. ඒ දක්වා කරන අනුසසුන් ඉද්ධි පාටිහාරියානුසාසනී නම්. (විමලකීර්ති හිමි, මැදඋයන්ගොඩ, 1959, 52 පිටුව).

මෙහි ධර්ම දේශනා ක්‍රම දෙකක් කියැවේ. එය බුද්ධ චාරිත්‍ර ගණයට අයත් වේ. මේ ගැන පොළොන්නරු යුගයේ රචනා වූ ගුරුළුගෝමී පඬිවරයාගේ අමාවතුර (ඤාණාලෝක හිමි, කෝදාගොඩ, 1969, 5 පිටුව) කෘතියේ ද ධර්ම දේශනා ක්‍රම දෙක සඳහන් වේ.

> 3. ධම්පියා අටුවා ගැටපදයෙහි 'වක්ඛලිථේරස්ස වත්ථු'වෙහි, යො ධම්මං පස්සති, යමෙක් ධම්හි උපන් ලොව්තුරා ධම් තුමා ළෙහි උපයා දකීදඃ සො මං පස්සති, ධම්මුවා බැවින් හේ මා දකී. 'ධම්මකායා තථාගතා' යනු මෙයට පමුණු. (විමලකීර්ති හිමි, මැදඋයන්ගොඩ, 1959, 278 පිටුව). ධර්මයෙන්ම සැදුණු සිරුර යන අරුතයි.

'ධම්මකාය' හෙවත් ධර්මය දරන සිරුර වෙනුවට ධර්මප්‍රදීපිකාවේ බුද්ධ ස්වරූපය වචන තුනකින් පැහැදිලි කරයි. රූප විලාස යනුවෙන් දෙතිසක් මහපුරිස් ලකුණු සහ අසූවක් අනුව්‍යඤ්ජන නාමිකව පළමු වරට අපට සිංහල පොතක හමු වන්නේ ධර්මප්‍රදීපිකාවේය.

ධර්මප්‍රදීපිකාව පාලි මහාබෝධිවංසයේ ගැටලු පද 205කට ලියන ලද පරිකතා ග්‍රන්ථයකි. බුද්ධ වචනයඃ වචන විලාස යනුවෙන් බුද්ධත්වයේ පටන් දේශිත සමස්ත ධර්ම දේශනා අයත් කර ඇත. ඤාණ විලාස යනුවෙන් දේශිත සියලු ධර්මය සඳහා භාවිත සර්වඥතාඥානය ඇතුළු ඒ ඒ ස්ථානයන්හි දී භාවිත ධ්‍යානා ධ්‍යාන ඥාන ආදී ඥාන විග්‍රහයක් සිදු කර ඇත. ඒ අනුව ධම්පියා අටුවා ගැටපදයට මහායාන දර්ශනයේ බලපෑමෙන් ධම්මකාය යන වචනය භාවිත කළ බවට අනුමාන කළත්, ථේරවාද සම්ප්‍රදායේ ධර්මය දරන ශරීරය යන අරුතින් ධම්මකාය යන්න 'බුදුන්වහන්සේට' යෙදේ. ධර්මප්‍රදීපිකාවේ එය 'බුදුන්වහන්සේගේ වචන විලාස' යනුවෙන් සඳහන් වේ. (විමලවංශ හිමි, බද්දේගම,1959, 52 පිටුව.)

4. මහාපුරිස ලක්ඛණ අසීත්‍යානුබ්‍යඤ්ජන, 'චක්ඛඞ්කිත පාදතාදී මහාපුරිස ලකුණු හා සම්බන්ධ තුඞ්ග නාසතා දී අනුබ්‍යඤ්ජන ඇතිඃ (විමලකීර්ති හිමි, මැදඋයන්ගොඩ, 1959, 126 පිටුව.) යනුවෙන් ධම්පියා අටුවා ගැටපදයේ ද ධර්මප්‍රදීපිකාවේ මහාපුරිස් ලකුණු නමින් විස්තර වශයෙන් ද (විමලවංස හිමි, බද්දේගම, 1959, 08 පිටුව) පූජාවලියේ (ඥානවිමල හිමි, කිරිඇල්ලේ, 2005, 25 පිටුව) ඊටත් වඩා සංවර්ධනය වූ අවස්ථාවක් ද දැකිය හැකිය. රාජසුකුමාල බව රජපවුලක ඉපදීමෙන් ලැබෙන්නකි. එනම් රජෙකුට හිමි සියලු සම්පත් විඳීමට ලැබෙන අවස්ථාවයි.

2. බෝධි සංකල්පය

2.1 බෝධි යනු සිවුසස් දහම් අවබෝධ කර ගැනීමේ ඥානයයි. 'තං බෝධි වුච්චති චතුසු මග්ගේසු ඤාණං' (ධම්මපාල හිමි, ගතාරේ, සංස්. 1985, 3-4 පිටු/ ධම්මරක්ඛිත හිමි, වැලමිටියාවේ, 1991, 12 පිටුව). එය මුල් බුදුසමයෙන් ම පැවත එන්නකි. බුද්ධ, පච්චේක බුද්ධ, අරහන්ත බුද්ධ, අනාගාමි, සකෘදාගාමී, සෝතාපත්ති ආදී ධර්මාවබෝධය ලැබීමේ පිළිවෙළ ක්‍රමයක් ධර්ම මාර්ගයේ සඳහන් වේ.

2.2 'බෝධි' යන්න ධම්පියා අටුවා ගැටපදයේ 'සිවුසස් අවබෝධයෙන් පසු කාලය' හඳුන්වන්නට ද යෙදී තිබේ.

'පඨම බෝධිය, පළමු බෝ අගැ. පඨම බෝධි නම්, පළමු දෙදසකයැ. මජ්ඣිම බෝධි නම්ඃ තුන්වන දසකයැ. පච්ඡිම බෝධි නම්ඃ-සතරවන දසකයැඃ-'(විමලකීර්ති හිමි, මැදඋයන්ගොඩ, 1959, 237පිටුව)

2.3 පච්චේක බුද්ධ යනුවෙන් හඳුන්වන්නේ ප්‍රත්‍යක්ෂ ඥානයෙන් ධර්මය අවබෝධ කර ගැනීමේ හැකියාව ඇති ඤාණවන්තයායි. එසේ වුවත් ධර්ම දේශනීය ශක්‍යතාව නැති බව සම්බුද්ධත්වයෙන් පච්චේක බුද්ධත්වය වෙනස් වන අවස්ථාවයි. දේශනීය ප්‍රඥාව සම්බුද්ධත්වයේ විශේෂත්වයකි.

2.4 අරහන්ත බුද්ධ යනුවෙන් හඳුන්වන්නේ බුද්ධ දේශනාවක් හෝ බුද්ධ ශ්‍රාවක දේශනාවක් හෝ අසා නිකෙලෙස් තත්ත්වයට පත්වීමේ හැකියාව ඇති ඤාණවන්තයායි. එමෙන්ම ධර්මදේශනා කිරීමෙන් ධර්මාවබෝධය කරවීමේ හැකියාව ඇති බවයි.

විශුද්ධිමාර්ග මහා සන්නයේ ෂඩනුස්මෘතීන්හි බුද්ධානුස්මෘතිය යටතේ 'බුද්ධ' යන්න විග්‍රහ කෙරේ.

> 1....'සම්මා සම්බුද්ධො' යන මෙයින් සංක්ෂේපයෙනුදු විස්තරයෙනුදු ශාස්තෘහුගේ චතුස්සත්‍යාවබෝධය උක්තයි. පූර්ව වචනයෙන් හෝ ශාස්තෘහුගේ ප්‍රතිවේදඥානානුභාවය දර්ශිතයි. පශ්චිම පදයෙන් දේශනා ඥානානුභාවය දර්ශිත යයි වක්ෂ්‍යමා විශේෂයද්‍යෝතික වෙයි දතයුතු. සබ්බස්ස බුද්ධත්තා, 'සියලු ඥෙය දත් හෙයින්ඃ විමොක්ඛන්තික ඤාණවසෙන බුද්ධො, විමෝක්ෂාන්තික ඤාණ වශයෙන් බුද්ධ නම් වේ. සියලු කෙලෙසුන් කෙරෙන් විමුක්ත වූ හෙයින් රහත්මග විමෝක්ෂ නම්. විමෝක්ෂාවසානයෙහි උපදනා බැවින් රහත්ඵලය විමෝක්ෂාන්ත නම. රහත්ඵලය ලද කල ලැබියයුතු බැවින් සවුනේ (සර්වඥතාඥානය හෙවත් සියල්ල දන්නා නුවණ යි.) දන්නා නුවණ විමෝක්ෂාන්තික ඥාන නම්. ඒ නුවණින් බුද්ධ නම් විය යන අර්ථයි. (සද්ධාතිෂ්‍ය මහාස්ථවිර, බෙන්තරඃ 1949, 503 පිටුව)
>
> මෙම කීහ ටීකාවෙහි 'සබ්බසො පටිපක්ඛෙහි විමුච්චතීති-විමොක්ඛොඃ අග්ගමග්ගො, තස්ස අන්තො අග්ගඵලං, තත්ථ භවං තස්මිං ලද්ධෙ ලද්ධබ්බතො=විමොක්ඛන්තිකඤාණං, සබ්බඤ්ඤුත ඤාණෙන සද්ධිං සබ්බම්පි බුද්ධඤාණං'යි. යස්මා වා, යම් හෙයකින් හෝඃ චත්තාරි සච්චානි අත්තනාපි බුජ්ඣි, චතුස්සත්‍යයෙන් තෙමේ ද දතඃ අඤ්ඤෙපි සත්තෙ බෝධෙසි, සෙසු සත්ත්වයනුදු දන්වීයැඃ බුද්ධො, බුද්ධ නම් වේ. ඉමස්ස ච පන්ථස්ස විඤ්ඤාපනත්ථං, චතුස්සත්‍යයන් තමා දත් හෙයිනුදු බුද්ධ නම් වෙයි. යන මේ අර්ථය හඟවන පිණිසඃ බුජ්ඣිතා සච්චානීති බුද්ධො, සත්‍යයන් දතිනුයි බුද්ධ නම්ඃ බෝධෙතා පජායාති බුද්ධො, සත්ත්වයන් දන්වානුයි බුද්ධ නම් වෙයි. ඒවං පවත්තො සබ්බෝපි නිද්දේස නයො, සබ්බඤ්ඤුතාය බුද්ධො, සබ්බ දස්සාවිතාය බුද්ධො' යනාදීන් මෙසේ ප්‍රවෘත්ත සියලු නිර්දේශ නය හොඃ පටිසම්භිදා නයො වා, පිළිසිඹියා නය හෝඃ විත්ථාරෙතබ්බො, විස්තර කටයුතු.'(සද්ධාතිෂ්‍ය මහාස්ථවිර, බෙන්තරඃ 1949,504 පිටුව)

මෙසෙයින් බුද්ධ සංකල්පය විස්තර කෙරෙන අතර ජනගත වී ඇති බුද්ධ, බෝධි, බෝසත් සංකල්ප ගැන විචාරාත්මක අධ්‍යයනයක් කර ඇති බණ සහ බුදුසමය කෘතියේ (අනුරාධා සුධම්මිකා භික්ෂුණිය, නාවලපිටියේ, 2020, සිවුවන පරිච්ඡේදය) ථේරවාද සම්ප්‍රදායේ ව්‍යවහාර පත්ව ඇති අටවිසි බුදුවරු, සූවිසි බුදුවරු, සිවු බුදුවරු, සත්බුදුවරු ගැන මූලාශ්‍රය ඇසුරින් විමසුමට භාජන කර තිබේ.

බෝධි සංකල්පය යටතේ තොරතුරු විමර්ශනය කිරීමේ දී පාලි බෝධි වංසයට ලියන ලද බෝධිවංස ග්‍රන්ථිපදයෙහි බෝධි යන්න ඥාණ අර්ථයේ යෙදෙන බවත් බෝධි යන්න ගෞතම බුදුන්වහන්සේට ඥාණය ලැබීමට සෙවන දුන් අස්වත්ථ හෙවත් ඇසතු වෘක්ෂයට ගෞතම බුදුන්වහන්සේගේ බුද්ධත්වයෙන් පසුව ලැබුණු පර්යාය පදයක් බවත් සඳහන් වේ. (ධම්මපාල හිමි, ගතාරේ, සංස්. 1985, 3-4 පිටු)

බෝධිවංසය ලියා ඇත්තේ වෘක්ෂ අර්ථය ගැනෙන අස්වත්ථ හෙවත් ඇසතු රුක මුල දී ගෞතම සිද්ධාර්ථ තවුසාණන් අභිසම්බෝධියට පත් වීමෙන් අනතුරුව බෝධි හෙවත් අවබෝධය ලැබීමට සෙවන දුන් යන අරුතින් එම වෘක්ෂය හැඳින්වූ බව අවධාරණය කරමිනි. එබැවින් බෝධි වංසයෙහි විග්‍රහ වන්නේ එම බෝධීන්වහන්සේගේ වංස කතාවයි. ධර්මප්‍රදීපිකාවේ ආරම්භක ජේදයේ අප බෝධීන්වහන්සේට පුද පූජා කළයුත්තේ ඇයි? යන පැනයට පිළිතුරක් සපයා තිබේ.

> 'අප බුදුන් සරාසකි කප්සුවහස්මතුයෙහි කුලුනුනුවණින් යුත් මහතවුසක්වැ දිවකුරු බුදුන් හමුවැ අතට පත් නිවන් සසර සේ පියා සතුන් සඳහා විඳුනා දුක් නිවන් සේ ගෙන හවදුර්ගයට වැද පැරුම් පුරා තුසීපුර පැමිණ දසදහස් ලෝධාහි දෙව්බඹුන්ගේ අයජමෙන් කිඹුල්වත්හි ඉපිද වැඩිවිය පැමිණ මහබිනික්මන් කොට පැව්ජිවැ මහාවීර්ය කොට සර්වඥපදප්‍රාප්තවැ හුනස්නෙන් නැගී පූර්වෝත්තර දිශාභාගයෙහි වැඩ සිට සප්තාහයක් අනිමිස ලෝචන යුගලයෙන් පුදන ලද ඒ **ජය මහා බෝධිය**, තත් ප්‍රභව වූ එලරුහ මහා බෝධියැ තදවයව වූ ශාඛා මහා බෝධියැ යන තුන් මහා බෝධීන්ගේ වංශයෙහි...'(විමලවංස හිමි, බද්දේගම, 1959, 01 පිටුව) යනුවෙන්

තුන් මහා බෝධීන්ගේ වංශය බුද්ධිමත් පාඨක ජනතාවට බෝධිපූජාවේ වටිනාකම කෙටියෙන් අර්ථසම්පන්නව කියන්නේ. වන්දනාව යනු සාමාන්‍ය දෙයක් නොවන බව අවධාරණය කරමිනි.

අසංඛ්‍ය කල්ප ලක්ෂහතරක් මහා වීර්යයෙන් සිත පුහුණු කරමින් පැමිණි බෝධිසත්වයන් වහන්සේ දෙව්බඹුන්ගේ ආරාධනාවෙන් මනු ලොව ඉපිද වැඩිවිය පැමිණ මහබිනික්මන් කොට පැව්ජිවැ මහාවීර්ය කොට සර්වඥපදප්‍රාප්තවූ බුද්න්වහන්සේගෙන් කෘතවේදී පූජාවක් ලද, එබඳු උත්තමයකුට සෙවන දුන් වෘක්ෂ රාජයා සිත්හි දරා ගැනීමෙන් බුද්ධ පාරිභෝගික වස්තුවලින් පවා බුදුගුණ සිහි කිරීමට අවස්ථාව සලසා දෙන බැවින් වන්දනා මානනයට සුදුසු බව අවධාරණය කරමිනි.

පූජාවලියේ අටවිසි බුදුවරයන් වහන්සේලා ගැන සඳහන් කිරීමේ දී ඒ ඒ බුදුවරයන් වහන්සේ නමට එක් එක් බෝධි හෙවත් වෘක්ෂ සෙවන දුන් බව සඳහන් කරන තොරතුරු අන්තර්ගත කර ඇත. එය පශ්චාත්කාලීනව අටවිසි බෝධි වන්දනාව, අටවිසි බුද්ධ වන්දනාව ආදී වන්දනා ක්‍රම දක්වා (ඥාණවිමල හිමි, කිරිඇල්ලේ, 2006, 34 පරිः) සංවර්ධනය වූ කරුණු දාර්ශනික කරුණුවලට වඩා අන්තර්ගත වී තිබේ.

**සාහිත්‍ය විමර්ශනය**

සිංහල සාහිත්‍ය කෘති පාලි සංස්කෘත භාෂා ඇසුරින් සියවස් ගණනාවක් පුරා නිර්මාණය වී තිබේ. විවිධ දේශපාලනික ගැටුම් ගැටලු මැද රචනා වී, ශේෂ වී ඇති කෘතිවලින් පැරණිම කෘතිය සියබස්ලකරයි. දණ්ඩීන්ගේ කාව්‍යාදර්ශයේ අනුවර්තනයක් වූ සියබස්ලකර නම් සිංහල පද්‍යෝපදේශ ග්‍රන්ථයෙන් උපදෙස් සපයා ඇත්තේ පෙදෙන් බුදු සිරිතැ-ආදී වශයෙන් පද්‍ය සඳහා බුදු සිරිත යොදා ගන්නා ලෙසටය. එය අනුගමනය කළ සිංහල ග්‍රන්ථ කර්තෘවරු බුදු සිරිතට ප්‍රවේශයක් ලෙස බෝසත් චරිතය යොදා ගත්හ.

බුද්ධ ශාරීරික ධාතු, පාරිභෝගික ධාතු වන්දනය, පුදපූජා කෙරෙහි කොතරම් සැලකිල්ලක් දැකවූවෝ ද යත් **'ධාතුසු ඨිතාසු බුද්ධා ඨිතා හොන්ති'** යනුවෙන් ධාතුන්වහන්සේ වැඩ සිටීම යනු බුදුන්වහන්සේ වැඩ සිටිනවා හා සමානයයි ගෞරව පූර්වකව සිතූහ. ක්‍රියා කළහ. එමෙන් ම බුදුන්වහන්සේගේ පාරිභෝගික වස්තුවක් වූ බෝධින්වහන්සේ කෙරෙහි කොතරම් ගෞරව බහුමාන දැක්වීද යත් රජවරු ලංකා රාජ්‍යයෙන් බෝධින්වහන්සේ පිදූහ. එම බෝධි ඉතිහාසය ලියා තැබූහ. එම කෘතිවල නොවැටහෙන පදවලට අරුත් සපයමින් ගැටපද, පරිකථා, පදවර්ණනා ආදී ග්‍රන්ථ සිංහල පාඨකයින් අරමුණු කර ලිවූහ. ඒවායෙහි ආරම්භය බුද්ධ, බෝධි, බෝසත් සංකල්පවලින් පෝෂණය කර, ශ්‍රාවක පාඨක ජනයා ඥානනය කළහ.

බුද්දක නිකායේ පාලි ධම්මපද කෘතියට බුද්ධඝෝෂ හිමියන් විසින් රචිත පාලි ධම්මපදට්ඨකථාවේ ගැටලුපදවලට විවරණ සපයමින් ක්. ව. 10 වන සියවසේ දී ලියන ලද ධම්පියා අටුවා ගැටපදයත් පූර්වයෙහි පැවති සිංහල බෝධිවංසයයක පාලි පරිවර්තනයක් වූ පාලිමහාබෝධිවංසයේ ගැටලු පද 205කට ලියන ලද පරිකථා ඇතුළත්, ක්‍රි.ව. 12 වන සියවසට අයත් ධර්මප්‍රදීපිකාවත් මහාවංසය, විශුද්ධිමග්ගය, අපදානපාලි ආදී මූලාශ්‍රය භාවිතයෙන් දඹදෙණි යුගයේ දී රචනා වී ඇති පූජාවලියත් ක්‍රි.ව. පස් වන සියවසේ දී ලියන ලද පාලි විශුද්ධිමග්ගයට දඹදෙණි යුගයේ දී ලියන ලද විශුද්ධිමාර්ග මහා සන්නයත් මෙම පර්යේෂණයේ දී මෙම සංකල්ප පැහැදිලි කිරීමට තොරතුරු සපයා ගන්නා ලදි.

බෝසත් සිරිත ගැන ලේඛන ගත වී ඇති ජාතකපාළිය සහ එහි අට්ඨකථාව වූ ජාතකට්ඨකතා නම් කෘතිය පාදක කර ගෙන පශ්චාත් කාලීනව ලියැවුණු ජාතක පොත්වහන්සේට අයත් ජාතක කථා යොදා ගනිමින් රචිත කෘති විශේෂයෙන් සඳහන් කළ යුතුය.

වෙස්සන්තර ජාතක කථාව නමින් කෘතියක් පවතින්නට ඇත. එම පූර්ව මූලාශ්‍රයට ලියන ලද වෙසතුරුදා සන්නයෙන් වෙස්සන්තර ජාතකකථාවෙහි නොවැටහෙන වචනවලට අර්ථ සපයා ඇත. එමෙන්ම අටජාතකය නමින් ජාතක අටක් එකල ග්‍රන්ථයක් ලෙස පැවති අතර එම ජාතක අට විහාර සිතුවම්වල ද දක්නට ලැබේ.

පොළොන්නරු යුගයේ ගුරුළුගෝමී පඬිවරයා විසින්, පාලි මහාබෝධිවංශයේ ගැටලුපදවලට ලියන ලද ධර්මප්‍රදීපිකා ග්‍රන්ථයේත් බුද්ධ චරිතයේ බුදු ගුණ නවයෙන් එකක් වූ පුරිසදම්ම සාරථී බුදුගුණය පාදක කර ගෙන රචිත අමාවතුර නම් පදවර්ණනාවේත් විවිධ අවස්ථාවන්හි ජාතක කථා භාවිත කරමින් බෝධිසත්ව ජීවිතය ගැන පැහැදිලි කර තිබේ. උදාහරණ

වශයෙන් අමාවතුර කෘතියේ දී අප ගෞතම බුදුන්වහන්සේ තමන් බුද්ධත්වයට පෙර බෝධිසත්ව කාලයේ දීම පුරුෂයන් දමනය කළ ආකාරය කියන්නට ජාතක කථා 206ක් යොදා ගනිමින් එකම වාක්‍යයකින් පළමු පරිච්ඡේදය සරසයි. ඒ ආදී වශයෙන් බුත්සරණ, සද්ධර්ම රත්නාවලී ආදී සම්භාව්‍ය ගද්‍ය ග්‍රන්ථවලත් තම ග්‍රන්ථ අරමුණට ගැළපෙන පරිදි ජාතක කථා යොදා ගෙන තිබෙනු දක්නට පිළිවන. එහෙත් මේ කිසිදු ග්‍රන්ථයක් බෝසත් සංකල්පය ගැන සාකච්ඡා කර නැත.

සම්භාව්‍ය පද්‍ය සාහිත්‍ය කෘතීන් සලකා බැලීමේ දී ද මුවදෙව්දාවත මඛාදේව ජාතකය පදනම් කර ගනිමින් ද සසදාවත සස ජාතකය පදනම් කර ගනිමින් ද කුසදාවත හෙවත් කව්සිළුමිණ මහාකාව්‍යය කුස ජාතකය පදනම් කර ගනිමින් ද සිවුපද විරිතින් ලියා ඇති සඳකිඳුරුදා කව චන්දකින්නර ජාතකය පදනම් කරගනිමින් ද රචනා කර ඇත.

දඹදෙණි යුගයෙන් පසුව කුරුණෑගලපුර යුගයේ දී ජාතක පොත්වහන්සේ නමින් පන්සිය හතළිස් හතක් බෝධිසත්ව චරිතය මූලික කර ගත් කථා එකතුව ඇසුරින් පශ්චාත් කාලීන නිර්මාණවලට ද ආලෝකය සැපයී තිබේ. කෝට්ටේ යුගයේ රචනා වූ කාව්‍යශේඛර මහා කාව්‍යයට සත්තුභත්ත ජාතකය ද ගුත්තිල කාව්‍යයට ගුත්තිල ජාතකය ද සන්දේශ කාව්‍යයන්හි විවිධ ජාතකකථා උදාහරණ වශයෙන් භාවිත කර ඇත. එහෙත් ඒවායෙහි බෝසත් අවධීන්හි ක්‍රියාකාරකම්වලින් බෝසතුන් විශිෂ්ටත්වයට පත් වූ අයුරු සඳහන්ය. අපගේ පර්යේෂණය බෝසත් සංකල්පය ඇතුළු අනෙකුත් සංකල්ප ජීවිතවලට ප්‍රායෝගිකව භාවිත කරමින් ගැටලු නිරාකරණය කර ගත හැකිද යන්න විමසා බැලීමයි.

බෝධිවංශ ග්‍රන්ථි පද විවරණය, ගතාරේ ධම්මපාල හිමි මෙම පර්යේෂණයේ දී භාවිත කරන ලදි.

එම ද්විතීය මූලාශ්‍රයන්ට ලියැවුණු විචාර මූලාශ්‍රය කිහිපයක් ද අපට හමු විය. කොත්මලේ අමරවංශ හිමිගේ සාහිත්‍යලතා කෘතිය ශාස්ත්‍රීය ලිපි එකතුවකි. වැලමිටියාවේ ධම්මරක්ඛිත හහිමියන්ගේ 'ශ්‍රී මහා බෝධීන්වහන්සේ හා තදනුබද්ධ මූලාශ්‍රයන්හි ඇතුළත් සංස්කෘතිය' කෘතියෙහි ඥානය මූලික කරගත් බෝධි ශබ්දය ද වෘක්ෂාර්ථයේ යෙදෙන බෝධි ශබ්දය විග්‍රහයට ලක් කර ඇත. එහි සංස්කෘතික කරුණු සාකච්ඡා කර තිබුණත් ගැටලු නිරාකරණයට එම සංකල්ප යොදා ගැනීමක් ගැන සාකච්ඡා කර නැත.

මිණිගමුවේ රතනපාල හිමියන්ගේ සිංහල සම්භාව්‍ය ගද්‍ය ග්‍රන්ථයන්හි නිරූපිත බුද්ධ සංකල්පය කෘතියේ තෝරාගත් කෘති කිහිපයක බුද්ධ සංකල්පය යෙදී ඇති ආකාරය ගැන සඳහන් වේ. නාවලපිටියේ අනුරාධා සුධම්මිකා මෙහෙණියගේ සංස්කරණයක් ලෙස හමු වන **බෝ විසිතුර** කෘතියෙහි බෝධි ඉතිහාසය සම්බන්ධ කරුණු ඇතුළත් ලිපි එකතුවකි. එහි බෝධි සංකල්පය ගැන විවිධ අර්ථ යටතේ තොරතුරු සපයා ඇත. එම කතුවරියගේ ම බණ සහ බුදුසමය කෘතියේ ජනගත වූ බුද්ධ සංකල්පය, බෝධි සංකල්පය, බෝසත් සංකල්පය ගැන සාකච්ඡා කර ඇත.

මහාචාර්ය ජේ.බී. දිසානායක මහතාගේ සිංහල බුදුසමය කෘතියෙහි බෞද්ධ දාර්ශනික සංකල්ප සිංහල ජන සමාජයේ ව්‍යාප්ත වී ඇති ආකරය විවිධ පැතිකඩ ඔස්සේ සාකච්ඡා කර ඇත.

මෙම කෘතිවල සත්පුරුෂ ජන සමාජයක් බිහි කිරීමෙහිලා දාර්ශනික සංකල්ප යොදා ගත හැකිදැයි සාකච්ඡා කොට නැත. ඉහත කී දාර්ශනික සංකල්ප තෝරා ගත් ව්‍යාඛ්‍යාන කෘතිවල ඇතුළත් වී ඇති ආකාරය මෙම පර්යේෂණ ලිපියට ප්‍රමාණවත් පරිදි උපුටා දැක්වීම් කරමින් විමසීමට ලක් කරන ලදි.

එම සංකල්ප ග්‍රන්ථාගත වී ඇති ආකාරය අනුව සංවර්ධන විමසීමේ දී ලාංකේය ජනසමාජය තුළ බුද්ධ වන්දනාවත් බෝධි යන්න වෘක්ෂාර්ථයෙන් වන්දනාවක් ලෙසත් භාවිත වේ. බෞද්ධ දාර්ශනික අරුත ජන ගත වී නැති බැවින් උගතුන් සඳහා රචිත ග්‍රන්ථයන්හි ඇතුළත් දාර්ශනික අරුත් ජනගත වී නැත. බෞද්ධ සංස්කෘතික වශයෙන් සංවර්ධන ඇත.

**නිගමනය**

එහෙත් එම දාර්ශනික සංකල්පයන්හි කියැවෙන බුද්ධිමත් බව, බුද්ධිමත්ව කටයුතු කිරීම, ඉවසීම (ත්‍රිලක්ෂණයට සිත යොමු කිරීම), කෘතවේදී බව යනාදී ගුණාංග හඳුනා ගැනීමෙන්, ප්‍රායෝගිකව භාවිත කිරීමෙන් ගැටුම් නිරාකරණය කර ගත හැකි වේ. එබඳු ජන සමාජයක් සත්පුරුෂ ජනසමාජයක් ලෙස හැඳින්විය හැකිය. බෞද්ධ දාර්ශනික සංකල්ප බුද්ධිමතුන්ටය. ඒවා බුද්ධිමත්ව හඳුනා නොගැනීමත් ප්‍රායෝගිකව ජීවිතයට බද්ධ කර නොගැනීමත් නිසා ගැටුම් බහුල වන බවත්, ගැටුම්වලට හේතු විමසීම සහ එහි ප්‍රතිඵල හඳුනා නොගැනීම නිසා ගැටුම් බහුල වී ඇති බව අපගේ නිගමනය විය. සත්පුරුෂ ජන සමාජයක් සඳහා මෙම සංකල්ප දැනුවත් කොට ප්‍රායෝගිකව පුහුණු කරවීමෙන් පුහුණුවීමෙන් ගැටුම් අවම කර ගත හැකි වියහැකිය. එකිනෙකා කෙරෙහි කෘතවේදී ව කටයුතු කිරීමෙන් සත්පුරුෂ ජන සමාජයක් බිහිකර ගත හැකිය.

සිංහල සාමාන්‍ය ජනතාව බණ අසති. බෞද්ධ දාර්ශනික සංකල්ප ගැටලු විඳ දරා ගැනීමට භාවිත කරති. 'හැම දේම අනිත්‍යයි දුක්ඛයි අනාත්මයි...අනිච්චේ දුක්ඛෙ සංසාරෙ, කරුමෙ තමයි, උද්ධච්චෙ එක්ක මොකුත් කරන්න බැහැ, පිනට පහළ වුණු දේවල්, සංසාරෙත් යහපතම වෙන්න ඕන, නිවන් දක්ක වගේ' ආදී බෞද්ධ දාර්ශනික සංකල්ප එදිනෙදා භාවිතයෙන් තම සිත් සන්සුන් බවට පත් කර ගනිති. එබැවින් බෞද්ධ දාර්ශනික සංකල්ප හඳුනා ගැනීමට නුවණ පැවතිය යුතුය. එම භාවිතයෙන් දීර්ඝකාලීන ගැටුම් අවම කරගෙන සත්පුරුෂ සමාජයක් බිහි කර ගත හැකිය. ඒ සඳහා පුද්ගලයාගෙන් පුද්ගලයාට කැපවිය යුතුය යනු අපගේ නිගමනය විය.

**ආශ්‍රිත ග්‍රන්ථ නාමාවලිය**

**ද්විතීයික මූලාශ්‍රය i**


ධම්මපදට්ඨකථා, ධම්මානන්ද, සිරි සිද්ධත්ථ ගණාචාරිය, සිරි ඥාණිස්සරත්ථේරෙන සංසෝධිතා, 1935, බුද්ධසෝසත්ථෙරවරෙනකතා, පඨම භාගෝ, ජේ.ඩී. ප්‍රනාන්දු මුද්‍රාලයේ මුද්‍රාපිතා.

ධම්මපද විවරණය, සිරි ඥාණෝභාසතිස්ස හිමි, මොරගොල්ලේ, 1962, ගුණසේන සමාගම, කොළඹ, දෙවන මුද්‍රණය .

ධර්මප්‍රදීපිකා, විමලවංශ හිමි, බද්දේගම, (සංස්.)1959, ගුණසේන සමාගම, මරදාන.

ධර්මප්‍රදීපිකා ගැටපදය, මේධානන්ද හිමි, යටිපව්වේ, වාචිස්සර හිමි, දෙවුන්දර (සංස්.)1929, මහාබෝධි යන්ත්‍රාලයේ මුද්‍රාපිතයි.

බෝධිවංශ ග්‍රන්ථිපදය, ධම්මපාල හිමි, ගතාරේ, සංස්. 1985
මහාවංසො, බුද්ධදත්ත, පොල්වත්තේ ථේරෙන සංසෝධිතා, 1959, ගුණසේන, කොළඹ.
සද්ධර්ම රත්නාවලිය, ඥාණවිමල හිමි, කිරිඇල්ලේ, 1971, දෙවන මුද්‍රණය, ගුණසේන, කොළඹ.

**ද්විතීයික මූලාශ්‍රය ii**

අභිධානප්පදීපිකා, නාම පාළි නිඝණ්ඩුව, සිරි සුභූති හිමි, වස්කඩුවේ, සංස් .1938, 4 වන මුද්‍රණය, ශ්‍රී ලංකා ධර්මචක්‍ර පදනම, වීදාගම, බණ්ඩාරගම.
ඛුද්දක නිකායේ ධම්ම පදං, මලලසේකර, ගුණපාල, සංස්. 1966, සමස්ත ලංකා බෞද්ධ මහා සම්මේලනයේ ත්‍රිපිටක මුද්‍රණ භාර මණ්ඩලය
ජාතක පාළි, i, ii, iii, 2500 බුද්ධ ජයන්තිය, 2005, ලංකා බෞද්ධ මණ්ඩලය, පුනර් මුද්‍රණය, බෞද්ධ සංස්කෘතික මධ්‍යස්ථානය, නැදිමාල, දෙහිවල.
ජාතක පාළි, පඨම භාගෝ, පියතිස්ස, විදුරුපොළ මහාථේරෙන සංශෝධිතා, 1926,ත්‍රිපිටක මුද්දාලයේ මුද්දාපිතා..
ජාතකට්ඨකථා, දුතිය /තතිය භාගෝ, පියතිස්ස, විදුරුපොළ මහාථේරෙන සංශෝධිතා, 1928,/1931, ත්‍රිපිටක මුද්දාලයේ මුද්දාපිතා.
ජාතක අටුවා ගැටපදය, 1965, හෙට්ටිආරච්චි, ඩී.ඊ., රම්මණ්ඩල, එම්. ශ්‍රී.(සංස්.), ගුණසේන, කොළඹ.
ජාතක පොත්වහන්සේ i, ii, 2000, බෞද්ධ සංස්කෘතික දෙපාර්තමෙන්තුව, දෙහිවල,
පාලි මහා බෝධිවංසය, පියරතන හිමි, වෑගම, සංස්. 1996, ප්‍රථම මුද්‍රණය, ගොඩගේ, මරදාන.

**ද්විතීයික මූලාශ්‍රය iii- විචාර විමර්ශන**

අදිකාරම්, ඊ. ඩබ්ලිව්, පැරණි ලක්දිව බෞද්ධ ඉතිහාසය, දෙවන මුද්‍රණය, 2003, ගොඩගේ සහෝදරයෝ, මරදාන.
අමරවංශ නාහිමි, කොත්මලේ, සිංහල සාහිත්‍ය ලතා, 2000,ගොඩගේ, මරදාන, දෙවන මුද්‍රණය. අමරවංශ හිමි, කොත්මලේ, ලක්දිව සෙල්ලිපි, 1969, ගුණසේන, කොළඹ.
ආරියපාල, එම්. බී. 'මධ්‍යකාලීන ලංකා සමාජය' 1962, රාජ්‍ය භාෂා දෙපාර්තමේන්තුව, ලංකාණ්ඩුවේ මුද්‍රණාලයේ මුද්‍රාපිතයි.
කලුපහන, ඩී.ජේ. බෞද්ධ දර්ශන ඉතිහාසය, පළමු මුද්‍රණය, 2003, තිසර ප්‍රකාශන, පියසිරි ප්‍රින්ටින් සිස්ටම්ස්, බොරලැස්ගමුව.
කුලසූරිය ආනන්ද, සිංහල සාහිත්‍ය i, 1962, සමන් ප්‍රින්ටර්ස්, මහරගම.
ගල්මංගොඩ, සුමනපාල, ආභිධම්මික විවරණ සහ බෞද්ධ චින්තාවේ සංවර්ධනය, 2008, සරස්වතී ප්‍රකාශකයෝ, දිවුලපිටිය.
ගයිගර් විල්හෙල්ම්; 'Socity in Mediaeval Ceylon' 'මධ්‍ය කාලීන ලංකා සංස්කෘතිය'1969 (පරිවර්තනය), ඇම්. බී. ආරියපාල ගුණසේන, කොළඹ.
ඥාණාලෝක හිමි, කෝදාගොඩ සංස්. අමාවතුර, 1960. ගොඩගේ, කොළඹ.
ඥාණසීහ හිමි, හේන්පිටගෙදර, සියබස්ලකර විස්තර වර්ණනාව, 1964, ස්වභාෂා ප්‍රකාශකයෝ මුද්‍රණාලය, කොළඹ 10.
ඥානාරාම හිමි, පාතේගම, ජාතක සාහිත්‍ය විමර්ශනය, 1980, බෞද්ධ සංස්කෘතික මධ්‍යස්ථානය, නැදිමාල, දෙහිවල.
තිලකරත්න, අසංග, ශූන්‍යතාවාදයෙහි දර්ශනය හා චරණය, 2001, තිසර ප්‍රකාශන, නුගේගොඩ.
තිස්ස කුමාර, ආනන්ද, -10 වන සියවසේ රචිත ධම්පියා අටුවා ගැටපදයේ පද විද්‍යාත්මක අධ්‍යයනයක්, ප්‍රථම මුද්‍රණය, 2003, ගොඩගේ සහෝදරයෝ, මරදාන.
තෝමස්, එඩ්වර්ඩ් ජේ. කරුණා පෙරේරා, (පරි.) 1966, බුද්ධ චරිතය, ගුණසේන, කොළඹ.
දිසානායක, ජේ.බී, සිංහල බුදුසමය, ස්ටේට් කෝපරේෂන්, කොළඹ. (වර්ෂය සඳහන් වී නැත.)
ධම්මපාල හිමි, ගතාරේ, මහාබෝධි වංශ ග්‍රන්ථිපදය, 1985, පියසිරි ප්‍රින්ටර්ස්, ගංගොඩවිල.
නානායක්කාර, ගුණවර්ධන, පොළොන්නරු යුගයේ ව්‍යාඛ්‍යාන සාහිත්‍යය, 1998, ගොඩගේ සහෝදරයෝ, මරදාන.
පඤ්ඤාකිත්ති හිමි, කොටහේනේ සාහිත්‍ය කථා i, (ධර්මප්‍රදීපිකාව ගැන කෙරෙන පර්යේෂණයකි)
පඤ්ඤාකිත්ති හිමි, කොටහේනේ, සාහිත්‍ය කථා ii (ධම්පියාඅටුවා ගැටපදය ගැන කෙරෙන පර්යේෂණයකි), ද්විතිය මුද්‍රණය, 1964, විද්‍යාලංකාර විශ්ව විද්‍යාල මුද්‍රණය.
පඤ්ඤාකිත්ති හිමි, කොටහේනේ, සාහිත්‍ය කථා 3 , විද්‍යාලංකාර පිරිවෙන, කැලණිය.
ප්‍රඥාසාර හිමි, ඔක්කම්පිටියේ, ධම්පියා අටුවා ගැටපද ව්‍යාඛ්‍යාව, 2007, පළමු කොටස, කර්තෘ ප්‍රකාශන.
බණ සහ බුදුසමය, නාවලපිටියේ අනුරාධා සුධම්මිකා භික්ෂුණිය සංස්., සරසවි ප්‍රකාශන, නුගේගොඩ, 2020
බෂාම්, ඒ.එල්. අසිරිමත් ඉන්දියාව (පරිඃ), තුන්වන මුද්‍රණය, 1995, රාජ්‍ය භාෂා දෙපාර්තමේන්තුවේ ප්‍රකාශන අංශය, ලංකාණ්ඩුවේ මුද්‍රණාලය.
බුද්ධදත්ත හිමි, පොල්වත්තේ (සංස්.) පාලි මහාවංසො, පළමුවන මුද්‍රණය, 1959, එම්. ඩී. ගුණසේන, කොළඹ.
බෝ විසිතුර, නාවලපිටියේ අනුරාධා සුධම්මිකා භික්ෂුණිය සංස්., මාගධී ප්‍රකාශන, 2016
රතනපාල හිමි, මිණිගමුවේ, 2004, සිංහල සම්භාව්‍ය ගද්‍ය ග්‍රන්ථයන්හි නිරූපිත බුද්ධ සංකල්පය, ගොඩගේ, මරදාන.
රාහුල හිමි, වල්පොල, බුදුන් වදාළ ධර්මය, හයවැනි මුද්‍රණය, 1959, ගුණසේන සහ සමාගම, කොළඹ.
රාහුල හිමි, වල්පොල, ලක්දිව බුදුසමයේ ඉතිහාසය, 8 වැනි මුද්‍රණය, 2002, ගොඩගේ සහෝදරයෝ, මරදාන.
වික්‍රමසිංහ මාර්ටින්, ජාතක කතා විමසුම, 1968, පළමු මුද්‍රණය.
විමලරතන හිමි, බෙල්ලන්විල, බෞද්ධ මහා පුරුෂ සංකල්පය, ප්‍රථම මුද්‍රණය, 2000, බෞද්ධ සංස්කෘතික මධ්‍යස්ථානය, නැදිමාල, දෙහිවල.
වින්ටර්නිට්ස්, එම්., ඉන්දීය සාහිත්‍ය ඉතිහාසය, තුන්වන මුද්‍රණය, 1967, අධ්‍යාපන ප්‍රකාශන

දෙපාර්තමේන්තුව, ලංකාණ්ඩුවේ මුද්‍රණාලය.
සන්නස්ගල, පුංචිබණ්ඩාර, සිංහල සාහිත්‍ය වංශය, 2009, ගොඩගේ සහෝදරයෝ, මරදාන.
සාසනරතන හිමි, මොරටුවේ, ලක්දිව මහායාන අදහස්, 1962, විසිදුනු ප්‍රකාශකයෝ, බොරලැස්ගමුව.
සිරි තිලක සිරි, පොළොන්නරු සාහිත්‍යය, 2002, ගොඩගේ සහෝදරයෝ, මරදාන.
සිරිසුමන හිමි, අගලකඩ, සිංහල ව්‍යාඛ්‍යාන සාහිත්‍යයේ ප්‍රභවය සහ අර්ථ ව්‍යාඛ්‍යාන ක්‍රම, 2010, ගොඩගේ, මරදාන.
සීලරතන හිමි, හෙණ්ඩියගල, පුනර්භවය සහ නිර්වාණය, 1969, ශාස්ත්‍රෝදය මුද්‍රණාලය, පොත්හල, කුලියාපිටිය.
සෙනවිරත්න, අනුරාධ, ලක්දිව බුදු සසුන හා සිංහල සංස්කෘතිය (ශාස්ත්‍රීය ලිපි සංග්‍රහය), 2003, ගොඩගේ සහෝදරයෝ, මරදාන.
පාළි නිගණ්ඩු ග්‍රන්ථය, සුමනසාර හිමි, ඉමදූවේ, ඩබ්ලිව්. එස්. කරුණාතිලක- සිංහල හා ඉංග්‍රීසි සුචි සහිත අභිධානප්පදීපිකා
ශබ්දකෝෂ සහ විශ්වකෝෂ
ශ්‍රී සුමංගල ශබ්දකෝෂය i,ii, සෝරත හිමි, වැලිවිටියේ, 1999, ගොඩගේ සහෝදරයෝ, කොළඹ 10,

**Dictionaries and Encyclopedias-English**

Encyclopedia of Buddhism, vol.iii, G.P. Malalaekara, 1971 Published by Government of Ceylon, Printed by Government of Ceylon.,.
Dictionary of pāli proper Names, vol. ii.,Malalasekara G. P., 1938 London, John Murray, ALBEMARLE STREET, W.J. Published for the government of India; Indian text series, Printed in great Britain.
Oxford advanced dictionary, Chief Ed.Jonathan Crowther, 1996 Oxford University Press.
Sanskrit- English Dictionary, Sir Monier Williams, 1984. Cognate Indo-European languages, Mothilal Banarsidas, Delhi, (First Oxford published 1899).
English
Maha Bodhivamsa, edited by S. Strong, 1891, (Pali Text Society) PTS, London.
Adhikaram, E.W.Early History of Buddhism in Ceylon or ‘State of Buddhism in Ceylon as Revealed by the Pali commentaries of the 5th century A.D.’
Chandima Wijebandara, Early Buddhism: Its religious and intellectual Milieu, Published by Post Graduate Institute of Pali and Buddhist Studies, University of Kelaniya, Sri Lanka, 1993
Godakumbura C. E., Sinhalese Literature, 2nd edition, 1996, Department of cultural activities.
M.Winternitz, History of Indian Literature, vol.ii, 1983, Motilal Benasidass, Revised edition, Delhi,.
Nandasena, Mudiyanse, Mahayana monuments in Ceylon, 1967, Gunasena, Colombo.
Thomas, Edward J, Life of Buddha as legend and History, 1952, printed in Great Britain by Lund, Humphries & co. LTD, London, Third edition, Re printed A.M.Ghatage-The Narrative literature in Jaina Maharastri vol.xvi, - Aníls of the Bandarkhar oriental Research institute,
Kalupahana, David J ., Buddhist Philosophy-A Historical Book, 2008, Buddhist cultural center, Nadimala, Dehiwala, Sri Lanka,.
Arthur Strong, S. ed.,Mahabodhivamsa, 1891, Published for the Pali Text Socity, London.